# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 8 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය    කාලය : පැ 02

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) බුදුරජාණන්වහන්සේගෙන් පංච වරයක් ඉල්ලා සංඝ භේදයසිදු කළේ,
i) උපාලි හිමියෝය
ii) සුභද්‍ර හිමියන්ය
iii) දේවදත්ත හිමියන්ය
iv) ඡන්න හිමියන්ය

(2) බුදුරජාණන් වහන්සේ ගේ සුහදශීලි කතා බහ තුළ දැකිය හැකි "පුබ්බභාසී" යන ගුණාංගයෙන් අදහස් වන්නේ ,
i) කනට සුව එළවන කතාබහය
ii) සතුටු සාමීචි කතාබහය
iii) පළමුව කතාබහ කිරීමය.
iv) විවෘත කතාබහය.

(3) ඒ මොහොතේදීම ප්‍රතිඵල ලැබිය හැකි නිසා ධර්මය
i) සන්දිට්ඨිකය
ii) අකාලිකය.
iii) ඒහිපස්සිකය
iv) ඕපනයිකය

(4) බුදු හිමියන් ප්‍රමුඛ මහා සඟරුවනට දන් පිළිගන්වා තම දියණියන් පස්දෙනාම විවාහ කර දුන්නේ,
i) අනේපිඬු සිටුතුමා
ii) බිම්බිසාර රජු
iii) උග්ගහ සිටුතුමා
iv) විශාඛා මහ උපාසිකාව

(5) සැරියුත් මහ රහතන් වහන්සේ රහත් වූයේ ........................................... ශ්‍රවනය කිරීමෙන්ය.
i) තීරෝකුඩ්ඩසූත්‍රය
ii) ආදිත්ත පරියාය සූත්‍රය
iii) වේදනා පරිග්ගහ සූත්‍රය
iv) චක්කවත්තී සීහනාද සූත්‍රය

(6) බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාද ජනක පැවැත්ම උදෙසා දේශනා කර ඇති උසස් ආචාරධර්ම සමූහය හඳුන්වන්නේ,
i) සතර අගති නමිනි
ii) සේඛියා ධර්ම නමිනි
iii) අත්තූප නායික ධර්ම පරියාය නමිනි
iv) ආජීව අෂ්ටමක ශීලය නමිනි.

(7) භාරතයේ රජකළ චන්ඩාශෝක රජු ධර්මාශෝක බවට පත්වූයේ .................................... ගේ සංවරශීලී ගතිපැවතුම් දැනීමෙන්ය.
i) රාහුල තෙරුන්
ii) මිහිඳුමහ රහතන් වහන්සේ
iii) නිග්‍රෝධ සාමනේරයලන් වහන්සේ
iv) ආනන්ද තෙරුන්

(8) "කාව්‍යශේකරය" රචනා කර ඇත්තේ, .......................................... ය.
i) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්
ii) ටිබෙට් ජාතික එස් මහින්ද හිමි
iii) වීදාගම මෛත්‍රී හිමියන්
iv) වැත්තෑවේ හිමියන්

(9) "පෙකනිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා" යන පද්‍යයෙන් ප්‍රකාශ වන්නේ
i) කාන්තාවක් ගමනක් යායුතු ආකාරයයි.
ii) පුරුෂයන් ඇඳුම් ඇඳිය යුතු ආකාරයයි.
iii) කාන්තාවන් ඇඳුම් ඇඳිය යුතු ආකාරයයි.
iv) කාන්තාවන් ගේ දොර තබා ගත යුතු ආකාරයයි.

(10) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ,

i) අෂ්ටාංග ශීලයයි.
ii) දස සිලයයි
iii) උපෝසථ සීලය
iv) පංච සීලය

(11) බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති සිගාලෝවාද සූත්‍රයට අනුව බිරිඳකගෙන් ස්වාමිපුරුෂයාට ඉටු විය යුතු යුතුකමක් වන්නේ,

i) සම්මාන කිරීම
ii) අවමන් නොකිරීම
iii) වගකීම් පවරා දීම
iv) ඉපයූ ධනය ආරක්ෂා කිරීම

(12) පන්සිය පනස්ජාතක පොත රචනා වූයේ

i) කෝට්ටේ යුගයේදීය
ii) කුරුණෑගලග යුගයේදීය
iii) ගම්පොළ යුගයේදීය
iv) මහනුවර යුගයේදීය

(13) බුදුරජාණන්වහන්සේගේ දේශනාවට අනුව අට වැදෑරුම් දුකට අයත් නොවන්නකි.

i) ජාතිය හෙවත් ඉපදීම
ii) අප්‍රියන්ගෙන් වන්වීම
iii) කැමති දෑ නොලැබීම
iv) ප්‍රියන්ගෙන් වෙන්වීම

(14) යමෙකුගේ කර්ම ශක්තිය අවසන්ව මරණයට පත්වී ………………………………. මරණය නම්වේ.

i) ආයුක්ඛය
ii) කම්මක්ඛය
iii) උභයක්ඛය
iv) උපඡේදකය

(15) පංචස්කන්ධයට අයත් නොවන්නේ,

i) සංඛාරා
ii) වේදනා
iii) විඤ්ඤාණ
iv) ඇස

(16) තන්හාවේ ප්‍රභේද තුන වන්නේ

i) රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා,
ii) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා,
iii) ලෝභ, ද්වේශ, මෝහ
iv) දුක්ඛ දුක්ඛ, විපරිනාම දුක්ඛ, සංඛාර දුක්ඛ

(17) බුදු දහමට අනුව කර්මය සිදුවන දොරටු තුන වන්නේ.

i) ඇස, කණ, නාසය
ii) සිත, කය, වචනය
iii) රාග, ද්වේශ, මෝහ
iv) ශීල, සමාධි, ප්‍රඥා

(18) බෝසතාණන් වහන්සේගේ උපාය කෞශල්‍ය පිළිබඳව පිළිබිඹු වන ජාතක කතාවකි.

i) වෙස්සන්තර
ii) උම්මග්ග
iii) සඳකිඳුරු
iv) චුල්ල පදුම

(19) දස අකුසල කර්මයන්ට අයත් නොවන්නේ,

i) සතුන් මැරීම
ii) නිවැරදි දෘෂ්ටියක් ඇතිකර ගැනීම
iii) විෂම ලෝභය
iv) අදත්තා දානය

(20) ලෝක පාලන ධර්ම හෙවත් දේව ධර්ම ලෙස හැඳින්වෙන්නේ,

i) අත්තූපනායික ධර්ම පරියාය
ii) හිරි ඔත්තප්ප
iii) ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලය
iv) අටලෝ දහම

**11 කොටස**

(1) බුද්ධ ධර්මය විෂයට අදාළව ඔබ දෙවන වාරයේදී සිදු කළ ඇගයීම ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i) දෙවන වාරය සඳහා සිදු කිරීමට ඔබට ලැබුනු ඇගයීම කුමක්ද?
ii) එම ඇගයීම සඳහා යොදා ගත් පාඩමේ නම කුමක්ද?
iii) එම ඇගයීම සිදු කිරීමට පෙර ගුරුතුමා/ගුරුතුමිය ඔබට ලබා දුන් උපදෙස් 02 ක් ලියන්න.
iv) එම ඇගයීම සිදු කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටළු 02 ක් සඳහන් කරන්න.
v) එම ගැටළු විසඳා ගැනීමට ඔබ ගත් පියවර 02 ක් සඳහන් කරන්න.
vi) මෙම ඇගයීම සිදු කිරීමෙන් ඔබට ලැබුණු අත්දැකීම් 02 ක් ලියන්න.
vii) අදාළ ඇගයීම සිදු කිරීමේදී ඔබ සහාය ලබාගත් පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.
viii) මහෝෂධ කුමරු තම ප්‍රඥා මහිමයෙන් විසඳූ ගැටළු 02 ක් සඳහන් කරන්න.
ix) වේදේහ රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ පඬිවරු සතර දෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න.
x) මහෝෂධ කුමරුගේ මව්පියන් නම් කරන්න.

(2)

i) ධර්ම රත්නයේ ගුණ අතරින් 2 ක් සඳහන් කරන්න.
ii) "කාලයක් නැතිවම...."කවිය සම්පූර්ණ කරන්න.
iii) දහම් ගුණ ඇතුළත් පාඨය <u>නිවැරදිව</u> ලියන්න.

(3)

i) බුදුන්වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ සිවුරු හැඳීම සහ පෙරවීම පිළිබඳව පනවා ඇති සේඛියා ශික්ෂා පද අතරින් 2 ක් සඳහන් කරන්න.
ii) බුද්ධ දේශනාවට අනුව ඇඳුම් ඇඳීමේ පරමාර්ථ 3ක් ලියා දක්වන්න.
iii) අපත්‍ය ආහාර අනුභව කිරීම තුළින් පුද්ගල පෝෂණයට හානි සිදුවන අයුරු පැහැදිලි කරන්න

(4)

i) ගිහියන් විසින් පෙහෝ දින සමාදන් වූ සීලයන් 02 ක් සඳහන් කරන්න.
ii) අෂ්ටාංග ශීලයෙහි පළමු, දෙවන හා තෙවන සිල් පද ලියා දක්වන්න.
iii) මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් මිනිසා විනාශයට පත්වන ආකාරය පැහැදිලි කරන්න.

(5)

i) බුදුන්වහන්සේ විසින් සිගාලෝවාද සූත්‍රය දෙශනා කරනු ලැබුවේ කා හටද?
ii) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි භාර්යාව විසින් තම ස්වාමියාට ඉටු කළ යුතු යුතුකම් අතරින් තුනක් සඳහන් කරන්න.
iii) යහපත් දිවි පැවැත්මක් උදෙසා කළණ මිතුරු ඇසුර ඉවහල් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(6)

i) කර්මය දෙයාකාරය ඒ මොනවාද?
ii) වචනයෙන් සිදුවන අකුසල් 04 අතරින් තුනක් නම් කරන්න.
iii) නිරතුරුව කුසල් රැස් කිරීම තුළින් සැපවත් ජීවිතයක් ගතකළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක්</u> සඳහා කෙටි සටහන් ලියන්න.

i) බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගුණාංග
ii) අංගුලිමාල තෙරණුවෝ
iii) සහජීවනයෙන් කටයුතු කරමු
iv) කර්මය